(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 1(12).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 ඔක්තෝබර් 23 සිකුරාදා**

---

**2020 නොවැම්බර් 03 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විසර්ජන (2020) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විසර්ජන (2021) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කර්මාන්තශාලා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2020 නොවැම්බර් 06 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා.50/2020

ගරු එච්. නන්දසේන මහතා,— වසර 40කට අධික කාලයක් පුරා ස්ථිර නිවාසවල පදිංචිව සිටින (බලපත්‍ර සහිත හෝ රහිත) පදිංචිකරුවන් සඳහා ඉඩම්වල අයිතිය ලබාදීම,— වසර 40කට අධික කාලයක් ස්ථිර නිවාස ඉදිකර ගනිමින් පදිංචිව සිටිය දී පසුකාලීනව වනජීවී ප්‍රදේශ ලෙස ගැසට් කිරීම හෝ ජනතාව දැනුවත්කිරීම නිසා ජයභූමි ඔප්පු හෝ වෙනත් දීමනා පත්‍ර ලැබී තිබුණ ද, සියලුම සංවර්ධන කටයුතු අත්හිටුවීම නිසා පදවිය - කැබතිගොල්ලෑව මාර්ගයේ නිවාස, නගරය හා මූලික රෝහල් භූමිය සහ මිහින්තලය අංක 564 පොතාන තුලානේ නිවාස, සින්නක්කර හෝ පිඹුර සහිත කුඹුරු ඉඩම් හිමි පදිංචිකරුවන්ට තදබල අසාධාරණයක් සිදු වී ඇති හෙයින්, මෙම ඉඩම් නිදහස් කර දීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/2020

ගරු එච්. නන්දසේන මහතා,— උතුරු මැද පළාතේ සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම,— මූලය හඳුනා නොගත් වකුගඩු රෝගීන් බහුල ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති උතුරු මැද පළාත තුළ වර්තමානය වනවිට ජල පෙරණ සවිකරමින් තිබෙන හෙයින් ද, එනිසා වැඩිවන රෝගීන් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවක් දක්නට ඇති හෙයින් ද, සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම කඩිනම් කිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/2020

ගරු එච්. නන්දසේන මහතා,— සියලුම ගම්මාන සඳහා ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග ස්ථිර මාර්ග ලෙස සංවර්ධනය කිරීම,— දුෂ්කර ප්‍රදේශවල බොහෝ ගම්මාන සඳහා ඇත්තේ එකම පිවිසුම් මාර්ගයක් පමණක් හෙයින් ද, වසර ගණනාවකින් ඒවා සංවර්ධනය කර නොමැති හෙයින් ද, මෙම සියලුම පිවිසුම් මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2020 නොවැම්බර් 18 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 සිට 2018 දක්වා කොළඹ, රත්නපුර, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති ජාතික පාසල්වල 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 සිට 2018 දක්වා ඉහත පාසල්වල —

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කොපමණද ;

(ii) එම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත 6 ශ්‍රේණියට ඇතුළත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 6 ශ්‍රේණියට ඇතුළත් වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ඇතුළත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පාසල්වල වර්ෂ 2010 සිට 2018 දක්වා 6 ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

51/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රථම කොවිඩ් - 19 ආසාදිත රෝගියා වාර්තා වූ දිනය කවදාද;

(ii) එදින සිට අද දක්වා දිනපතා වාර්තා වූ කොවිඩ් - 19 ආසාදිත රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එදින සිට දිනපතා සිදුකරන ලද පී.සී.ආර්. (PCR - Polymerase Chain Reaction ) පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(iv) කොවිඩ් - 19 රෝගය මැඩපැවැත්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

94/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජෛව අවි භාවිතය ලෝකයේ එකඟතාවය මත තහනම් වුවද විවිධ දේශපාලන හා වෙළඳ උපක්‍රම සඳහා රහසිගතව තවමත් භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාව ඇතුළු ඌන සංවර්ධිත රටවල් මෙම ජෛව අවි අත්හදා බැලීම් සඳහා ඉලක්ක වීමේ ඉඩක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජෛව අවි ප්‍රහාර වළක්වා ගැනීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

116/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවේ දැනට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝව තුළ ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල බස් රථ ඇණි හා මානව සම්පත වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

121/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මේ දක්වා ගිවිසුම්ගතව ඇති ආයෝජන සංඛ්‍යාව;

(ii) එම ආයෝජනවල වටිනාකම;

(iii) එම ආයෝජනවලින් දැනට වැඩ ආරම්භකර ඇති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

126/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිවු දිස්ත්‍රික්කයේ, පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ප්‍රධාන වැව් අතරින් එකක් වන නංජුන්ඩාන්කුලම් වැව ප්‍රතිසංස්කරණය කිරීමට පසුගිය රජය විසින් අනුමතිය ලබාදී, එයට මිලියන 40ක මුදල් ප්‍රතිපාදන ද වෙන්කරන ලද නමුත්, අඛණ්ඩව ඇද වැටුණු වර්ෂාව හේතුවෙන් මෙම ප්‍රතිසංස්කරණ වැඩකටයුතු සිදුනොකර ප්‍රතිපාදන ආපසු යවා ඇති බවත්;

(ii) මෙම වැව යටතේ බොහෝ කුඹුරු හා ගොඩඉඩම් තිබෙන අතර ග්‍රාමීය ජනතාව තම ජීවනෝපාය සඳහා මෙම වැව කෙරේ විශ්වාසය තබාගෙන ඇති බවත්;

(iii) නංජුන්ඩාන්කුලම් වැව් බැම්මේ තිබෙන අනවශ්‍ය ගස් කපා ඉවත් කිරීම සඳහා දැව සංස්ථාවට අනුමතිය ලබා දී ඇතත්, ප්‍රවාහනය සඳහා මාර්ගය අබලන් වී ඇති බැවින් මෙතෙක් එය ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම නංජුන්ඩාන්කුලම් වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩකටයුතු සඳහා මුදල් වෙන්කරන දිනය කවරේද;

(ii) ප්‍රවාහනය සඳහා මාර්ගය පිළිසකර කර, ඉහත වැව ප්‍රතිසංස්කරණයට අදාළ වැඩ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

151/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 14, ශ්‍රී සංඝබෝධි මහා විද්‍යාලයේ ඇති තෙමහල් ගොඩනැගිල්ලේ වහලය දිරාපත්ව එහි කොටසක් කඩා වැටී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් සිසු දරුවන් අනාරක්ෂිතභාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

221/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ඉලෙක්ට්‍රොනික උපකරණ ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

306/2020

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, කටුගස්තොට අධ්‍යාපන කලාපය තුළ 3 වර්ගයට (Type 3) අයත් පාසලක් වූ කසාවත්ත විද්‍යාලය පිහිටා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ මේ වනවිට —

(i) අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව;

(ii) භාවිතයේ පවතින පන්ති කාමර සංඛ්‍යාව;

(iii) භාවිතා කරන මුළු බිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසලේ භාවිතය සඳහා තිබූ ගොඩනැගිල්ලක්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් භාවිතයට නුසුදුසු බවට නිර්දේශ කර ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල භාවිතයෙන් ඉවත් කරන ලෙස දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ වෙනුවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

432/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අඩු ආදායම්ලාභී පවුල්වලින් රජයේ විශ්වවිද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්වය ලබා දුන් සමස්ත ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව;

(ii) එම ශිෂ්‍යත්වය ලැබීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහපොළ ශිෂ්‍යත්වය ලැබීම සඳහා සුදුසුකම් තිබුනද එම ශිෂ්‍යත්වය නොලැබෙන සිසුන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(ii) එවැනි සිසුන් සඳහා සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

454/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ - ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 493 විජිතපුර ග්‍රාම නිලධාරි වසමේ වත්මන් අග්‍රාමාත්‍යවරයා ධීවර අමාත්‍යවරයාව සිටි කාලයේ ආරම්භ කළ දියවර ධීවර ගම්මානයේ වත්මන් තත්වය එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගම්මානයේ ඉඩම්වලට ඔප්පු ලබා දීම සඳහා මූලික පියවර ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) එම ගම්මානයේ ඉඩම්වලට ඔප්පු ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

516/2020

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිබිල, මොණරාගල පාර, 1 කණුව, මඩමේවත්ත යන ලිපිනයේ පදිංචි පී.වී. වසන්ත රාණි මහත්මිය, ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් බිබිල රජයේ ගොවිපොළේ, පළාත් කෘෂිකර්ම ආයතනයේ කම්කරු තනතුරක 2017 වර්ෂයේ නොවැම්බර් සිට 2019 වර්ෂයේ දෙසැම්බර් දක්වා සේවය කර ඇති බවත්;

(ii) ඉහත සඳහන් සේවා කාලය තුළ ඇය අඛණ්ඩව දින 180ක් සේවය කර ඇති බවත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2019 ට අනුව ඇය ස්ථිර සේවයට හිමිකම් ලබා ඇති බවත්;

(iv) නමුත්, 2020 වර්ෂයේ ජනවාරි සිට ඇයගේ සේවය අත්හිටුවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සිය රැකියාව අහිමි වීම නිසා ඉතා අසරණභාවයට පත්ව සිටින වසන්ත රාණි මහත්මිය නැවතත් සේවයේ පිහිටුවීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

519/2020

ගරු සාණක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේනෙහි පිහිටා ඇති ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හසුරුවා ගත හැකි වුවත්, එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම නිසා විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හසුරුවීම ගැටලුවක් බවට පත්ව ඇති අතර ඒ හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාව පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලග්ගල ප්‍රාදේශීය රෝහල අලුතින් ඉදිකිරීම සඳහා රජය විසින් වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම රෝහලේ සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝහල සඳහා අනුමත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ වනවිට එම රෝහලේ සේවයේ නිරත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vii) දැනට එම රෝහලේ පවත්වාගෙන යනු ලබන සායන වර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

759/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති උතුරු පළාත තුළ පිහිටි වනාන්තරවලට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 1982 වනවිට ප්‍රකාශ කර තිබූ වනාන්තරවලට අයත් භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණයන් අතර වෙනසක් පවතින්නේ නම්, එම වෙනසට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තෝරගත් ප්‍රදේශයක් රක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) 2009 වර්ෂයේ සිට මේ වනතෙක් උතුරු පළාතට අදාළව අලුතෙන් වන ආරක්ෂණය සඳහා නිකුත් කළ ගැසට් පත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 නොවැම්බර් 19 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට හේතු කවරේද;

(iv) අදාළ පුරාවිද්‍යා ස්ථාන විනාශ කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන්ට ලබාදුන් දඬුවම් කවරේද;

(vi) විනාශ කර ඇති, එහෙත් ඊට වගකිව යුතු පුද්ගලයන් හඳුනා නොගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vii) රටක ඓතිහාසික අභිමානය සුරකින පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

52/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට විදේශගතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් සේවයේ නියුතු රටවල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් රටේ සේවයේ නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය නිසා පීඩාවට පත් වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

99/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ විල්පත්තු ජාතික වනෝද්‍යානය ප්‍රමුඛ වනාන්තර වැස්ම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වන බවත්;

(ii) මේ වනවිටත් උතුරු මැද පළාත අර්ධ කාන්තාර තත්ත්වයට පත්වී ඇති බවත්;

(iii) මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ සමස්ත දේශගුණයට බලපා ඇති බවත්;

(iv) එහෙයින් නිරන්තරයෙන් ශ්‍රී ලංකාවේ කුමන හෝ පළාතක් ගංවතුර, නියගය, නාය යෑම් ආදී ස්වභාවික ව්‍යසනවලින් පීඩා විඳින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පරිසරය සුරැකීමේ ජාතික ප්‍රතිපත්තින් සකස් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ විද්වත් කමිටුවක් හරහා අධ්‍යයනයක් සිදු කිරීම සුදුසු යැයි එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, එම අධ්‍යයනය සිදු කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

117/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කළ/කරන එක් එක් නිලධාරියාගේ ලිපිනය සහ නිලධාරියාට මාසිකව ගෙවන ලද වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ඔවුන් ලැබූ වැටුප් හා වෙනත් වරප්‍රසාදවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට ඔවුන්ගේ පාලන කාලය තුළ සමත් වී නැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තවදුරටත් වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

122/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනයේදී ඉවත් කරන ලද පොල් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොල් ගස් ඉවත් කිරීමේදී ඒවා ලබා දෙන ලද පාර්ශ්වයන් කවරේද;

(iii) ඒ සඳහා භාවිතා කළ ක්‍රමවේදය කවරේද;

(iv) එක් පොල් ගසකට ලබා දුන් මිල කොපමණද;

(v) එමගින් උපයා ගත් මුදල්, භාරයේ පවතින ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

152/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පිහිටි බ්ලූමැන්ඩල් විද්‍යාලයේ සිසු දරුවන් 400ක් පමණ අධ්‍යාපනය ලබන අතර එහි මලාපවහන පද්ධතිය පිළිසකර නොකිරීම හේතුවෙන් ගලි පියන් වෙනුවට ලෑලි යොදා වසා ඇති බවත්;

(ii) එම සිසු දරුවන් සඳහා නිසි වැසිකිළි පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

222/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ඖෂධ ප්‍රමාණය කොපමණද;

(ii) එම ඖෂධ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම ඖෂධ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ඖෂධ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

307/2020

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දෙමළ මාධ්‍ය පාසල්වල සිටින ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් මේ වනවිට සේවයේ නියුතු පාසල්වල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහනුවර දිස්ත්‍රික්කය තුළ සිටින —

(i) විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී පත්වීමක් ලැබුණද ශ්‍රේණියට අදාළව විදුහල්පති පත්වීමක් නොලද නිලධාරීන් සංඛ්‍යාව;

(ii) විදුහල්පති සේවයේ සුදුසුකම් නොමැති, එහෙත් දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන් ලෙස පත්වීම් ලබා ඇති නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ)(ii)හි සඳහන් පත්වීම් ලබාඇති ගුරුවරුන්ගේ විස්තර සහ ඔවුන් මේ වනවිට සේවය කරන පාසල් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

434/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) ඩෙංගු රෝගය විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) 2019 වසර තුළ ඩෙංගු රෝගය හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගය මර්දනය සඳහා ජාතික හා ප්‍රාදේශිය වශයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) ප්‍රාදේශිය ඩෙංගු මර්දන වැඩපිළිවෙළ සඳහා බඳවාගත් කම්කරුවන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

455/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිළිවෙලින් අංක 225, 226 සහ 227 දරන ග්‍රාම නිලධාරි වසම්වල ජීවත්වන ජනතාව වන අලි තර්ජනය නිසා තමන්ගේ ඉඩකඩම් අතහැර වෙනත් ස්ථානවලට සංක්‍රමණය වන තත්ත්වයක් උදාවී ඇති බවත්;

(ii) එම වසම්වල ජීවත්වන ජනතාව අලි වැටක් ඉදිකර දෙන ලෙස බලධාරින් දැනුවත් කළ ද මේ වනතෙක් ඊට විසඳුමක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

527/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි එක් එක් ජාතික පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, අදාළ තනතුරු නාමයන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

546/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බද්දේගම, අම්බලන්තොට, බෙන්තර - ඇල්පිටිය, කරන්දෙණිය සහ බලපිටිය යන මැතිවරණ බල ප්‍රදේශවල ජීවත්වන ජනතාව බරපතල පානීය ජල ගැටලුවකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රශ්නයට විසඳුම් සඳහා බද්දේගම ජල යෝජනා ක්‍රමයේ දෙවන අදියර සඳහා ඉදිරි අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) ඉහත කී ප්‍රදේශවල පවතින පානීය ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

591/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පවතින එකම උප අධ්‍යාපන කලාපය, පොතුවිල් උප අධ්‍යාපන කලාපය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කලාප කාර්යාලයේ, සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් දෙදෙනාට පරිපාලන වගකීම් නොපැවරීමට හේතු කවරේද;

(ii) විධිමත්ව බලය පවරන ලද උප අධ්‍යාපන කලාපයක් වුවත්, මෙලෙස නිලධාරින් නොසලකා හැරීමට ලක්වීම පිළිගත හැකිද;

(iii) මෙම තත්ත්වය හේතුවෙන්, සුළු රාජකාරියක් සඳහා වුවද පොතුවිල් කොට්ඨාසයේ ගුරුවරුන්ට අක්කරපත්තුව කලාප කාර්යාලයට යාමට සිදු වී ඇති බැවින්, එම ගැටලුව විසඳීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොතුවිල්හි සියලු පාසල් ඒකාබද්ධ කර පොතුවිල් ප්‍රදේශයට වෙනම අධ්‍යයන කලාපයක් පිහිටුවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එය පිහිටවනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) විවිධ ජන වර්ග එක්සත් කිරීම රජයේ අරමුණ වුවද, මුස්ලිම් පාසල් අක්කරපත්තුව කලාපය සමඟත්, දෙමළ පාසල් තිරුක්කෝවිල් කලාපය සමඟත්, සිංහල පාසල් අම්පාර කලාපය සමඟත් වෙන් වෙන් ව ඒකාබද්ධ කර ඇති බවත් එතුමා දන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

711/2020

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට වැසී ගොස් තිබෙන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) පෙර පාසල්වල පහසුකම් වැඩි කිරීම සඳහා රජය විසින් ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙර පාසල් ගුරුවරුන් සඳහා වැටුප් හෝ දීමනා ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(ii) පෙර පාසල් ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට හෝ ඒ හා සමාන වෙනත් ඒකාබද්ධ සේවයකට අන්තර්ග්‍රහනය කර ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) පෙර පාසල් ගුරුවරුන්ගේ බඳවා ගැනීම් හා ඔවුන්ගේ සුදුසුකම් තීරණය කිරීම ආදිය සම්බන්ධයෙන් යම් නියාමන ක්‍රමවේදයක් තිබේද;

(iv) පෙර පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් අය කරනු ලබන ගාස්තු නියාමනය කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෙර පාසල්වල අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව යෝජනා කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

727/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එවකට බලයේ සිටි ජනාධිපතිවරයා විසින් 2013 ජනවාරි මස 15 වන දින අගවිනිසුරු ධුරයට ව්‍යවස්ථානුකූලව පත් කරන ලද මොහාන් පීරිස් මහතාගේ පත්කිරීම, පසුව අවලංගු හා බල ශූන්‍ය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මොහාන් පීරිස් මහතාගේ අගවිනිසුරු ධුරය සඳහා වූ එම පත්කිරීම, අවලංගු හා බලශූන්‍ය කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 20 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

19/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ අප්‍රේල් මාසයේදී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රේඩාර් රිසීවරයක් හා ඇන්ටනා ස්කෑනරයක් අලුත්වැඩියාව සඳහා චීනයට යවා තිබූ බවත්;

(ii) එම භාණ්ඩ අස්ථානගත වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාරගත් සමාගම කවරේද;

(ii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම සමාගම තවමත් ශ්‍රී ලංකාවේ කවර හෝ රාජ්‍ය ආයතනයකට සේවා සපයන්නේද;

(iv) එම භාණ්ඩ අස්ථාන ගත වීමෙන් සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

65/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික පාසලක විදුහල්පති ධුරයක් දැරීමට තිබිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එසේ නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එසේ නියමිත සුදුසුකම් සපුරා නොමැති විදුහල්පතිවරු සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සෑම ජාතික පාසලක් සඳහාම නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

109/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දින සිට 2019.12.31 දක්වා වූ කාලය තුළ ආනයනය කරන ලද දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ආනයනය කළ ඉහත දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටලවලින් ඇතැම් ඒවා ශ්‍රී ලංකාවේ ධාවනයට නුසුදුසු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඉහත දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල මෙරටට ආනයනය කිරීමේ ක්‍රියාදාමය වෙනුවෙන් පත් කරන ලද ටෙන්ඩර් හා තාක්ෂණික කමිටු වල සාමාජිකයන්ගේ නම් හා තනතුරු;

(ii) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය ආරම්භ කරන දිනය කවරේද;

(ii) ඒ අනුව, රජයට ඉතිරිකර ගත හැකි මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

164/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ රජය විසින් ගෙවීමට ඇති, දේශීය හා විදේශීය ණය මුදල්, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ණය ලබාගත් දිනය හා ව්‍යාපෘතීන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ණය මුදල්වල වාරික ගෙවීම සඳහා රජය විසින් සකසා ඇති වැඩපිළිවෙළ කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

223/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සිමෙන්ති ප්‍රමාණය කොපමණද;

(ii) එම සිමෙන්ති ආනයනය කළ රටවල් කවරේද;

(iii) සිමෙන්ති ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සිමෙන්ති ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

435/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිනකට මාර්ග අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මාර්ග අනතුරු වලින් දිනකට මිය යන පුද්ගලයන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(ii) 2018 හා 2019 වර්ෂවල සිදු වූ මාර්ග අනතුරු වලින් මිය ගිය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාර්ග අනතුරු අවම කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය හි පවතින වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාර්ග අනතුරු අවම කිරීම පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කර තිබූ බව දන්නේද;

(ii) එම තේරීම් කාරක සභාව මගින් ලබා දී තිබූ නිර්දේශ හා නිගමන සැලකිල්ලට ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

448/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මදුසා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2019 වර්ෂයේදී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මෙම මදුසා පාසල් පිළිබඳ විශාල කතිකාවක් සමාජය තුළ ඇති වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම මදුසා පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර;

(ii) එම පාසල් සම්බන්ධව වත්මන් රජයේ ස්ථාවරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

456/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, කලාවැව ජලාශයේ සිට තිසාවැව ජලාශය දක්වා ජලය රැගෙන යන පැරණි යෝධ ඇල වල්බිහිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඇල මාර්ගය ශුද්ධ පවිත්‍ර කර යථාවත් කිරීමට වැඩපිළිවෙළක් තිබේද ;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

478/2020

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ආරම්භ කර ඇති ධීවර වරාය සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වැඩ නිම වී ඇති ධීවර වරාය සංඛ්‍යාව;

(iii) අළුතින් ඉදිකිරීමට අපේක්ෂිත ධීවර වරාය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මාවැල්ල නැංගුරම්පොළ, රැකව නැංගුරම්පොළ, හම්බන්තොට ධීවර වරාය සහ ගන්දර ධීවර වරාය යන වරායවල්වල වර්තමාන තත්ත්වය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

520/2020

ගරු සාණක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුන්නෙකුඩා, කෝට්ටෙයිකල්ලාරු ආදි ප්‍රදේශවල සඳහා මෝයකටවල් (Bay Mouth Gates) ඉදිකර බෝට්ටු නැවැත්වීමේ පහසුකම් සැලසීම මඟින් දේශීය ධීවරයින් බොහෝ දෙනෙකුට ප්‍රයෝජන ගත හැකි බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ප්‍රදේශවල මෝයකටවල් ඉදිකිරීමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

529/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම් අතරින් මේ වනවිට ස්ථිර ග්‍රාම නිලධාරින් සිටින වසම් සංඛ්‍යාව කොපමණද;

(iv) ස්ථිර ග්‍රාම නිලධාරින් නොමැති වසම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ස්ථිර ග්‍රාම නිලධාරින් නොමැති වසම්වල ඇති ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

542/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් ආරම්භ කරන ලද මධ්‍ය මහා විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍ය මහා විද්‍යාලවල 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් ආරම්භ කරන ලද මධ්‍ය මහා විද්‍යාලයක් කුලියාපිටිය මැතිවරණ බලප්‍රදේශයේ පිහිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා ඉහත (ආ) හි සඳහන් විද්‍යාලයේ 6 ශ්‍රේණිය සඳහා ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඇතුළත් කර ගන්නා ලද ඉහත එක් එක් සිසුවා 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම විද්‍යාලයට ශිෂ්‍යත්ව කඩඉම් ලකුණට පහළ ලකුණු ලැබූ සිසුන් කොපමණ සංඛ්‍යාවක් ඇතුළත් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

557/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාළු විදීමේ ක්‍රීඩාවේ යෙදීම සඳහා විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට පැමිණෙන බවත්;

(ii) ඔලිම්පික් ක්‍රීඩාවක් වන මෙම ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ සිදු කිරීමට නොහැකි වන පරිදි නීති සැකසී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයන්ට නැවත එම ක්‍රීඩාවේ යෙදීමට හැකි වන පරිදි ඉහත නීති සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

653/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට එල්ලල රක්ෂිතය, හොරොව්පතාන රත්මලේ රක්ෂිතය සහ මහදිවුල්වැව අඩියාහින්න රක්ෂිතය ඇතුළු රක්ෂිත වනාන්තර කිහිපයක වන විනාශයන් සිදු කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම වන විනාශයන් සිදු කළ පුද්ගලයන්ට විරුද්ධව පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) එම රක්ෂිතවල විනාශ කර ඇති වන භූමි ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(iii) මේ වනවිට වන විනාශය රැල්ලක් ලෙස ශ්‍රී ලංකාවේම ව්‍යාප්තවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

728/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීංගඟ පානීය ජල යෝජනා ක්‍රමයේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම යෝජනා ක්‍රමයේ ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු කවරේද;

(iii) එම යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) ගිවිසුම් ප්‍රකාරව මෙම යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කළ යුතු දිනය කවරේද;

(v) නියමිත දිනට මෙම යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?